**නිපුණතා මට්ටම:- 7.1 -** ගී පද රචනාවක සුවිශේෂී ලක්ෂණ හඳුනාගනිමින් ගී පද නිර්මාණය කර තනු නිර්මාණය කරයි.

⋆ පහත කියවීම් පත්‍රිකාවේ සඳහන් ක්‍රියාකාරකම් පියවරෙන් පියවර සිදු කරන්න.

<u>ගී පද නිර්මාණය හා තනු නිර්මාණය</u>

- විවිධ මාතෘකා /තේමා/අත්දැකීම් ඔස්සේ ගී පද නිර්මාණය කිරීම සම්බන්ධ ව පෙර වසර වල ඔබගේ දැනුම ප්‍රයෝජනයට ගන්න.
- තේමාවට උචිත පද භාවිතය / තේමාවෙන් ප්‍රකාශ කිරීමට බලාපොරොත්තු වන අරුත පදමාලාව තුළ අන්තර්ගත කිරීම හා ගී පද වල රිද්මය මතු කරමින් සාර්ථක නිර්මාණයක් කිරීමට උත්සාහ ගන්න. පහත තේමාවන් ද ගී පද නිර්මාණය කිරීමට යොදා ගන්න.
- මුහුද /අහස/සඳ/ තරු / වැස්ස/පරිසරය / අම්මා / තාත්තා/ මව්බිම ආදී මාතෘකා හෝ සමාජයට යහපත් පණිවුඩයක් දිය හැකි මාතෘකාවක් තෝරා ගෙන ගී පද නිර්මාණයක් කරන්න.
- මීළඟට ඔබ නිර්මාණය කළ ගීතය රිද්මයානුකූල ව කියවමින් පදමාලාව ට ගැලපෙන රිද්මය තෝරා ගන්න.
- සංගීත භාණ්ඩයක ආධාරයෙන් ගැලපේ යැයි සිතෙන ශ්‍රැතියක් තෝරා ගනිමින් පද පෙළින් පෙළ ගායනා කරමින් තනුව නිර්මාණය කිරීම ට උත්සාහ ගන්න.
- මූලික ශ්‍රැතිය නොබිඳෙන සේ පද මාලාව ක්‍රමයෙන් පෙළින් පෙළ සකසන්න. නැවත නැවත ගායනා කරමින් තනුව තව තවත් ස්ථිර ව අවබෝධ කර ගන්න.
- වඩාත් සාර්ථක තනු නිර්මාණයක් සඳහා ඔබේ ස්වර ඥානය ප්‍රයෝජනයට ගත යුතු අතර ස්වර ප්‍රස්ථාර කිරීමේ හැකියාව ප්‍රයෝජනයට ගනිමින් ගීතයේ පද හා තනුව ප්‍රස්ථාර ගත කරන්න.
- ස්මාට් දුරකතනයක රෙකෝඩින් ඇප් (RECORDING APP) භාවිතයෙන් තනුව යෙදූ පද මාලාව ගායනා කරමින් රෙකෝඩ් කර ගන්න. එය නැවත නැවත අසමින් තනුව තවදුරටත් රසවත් මිහිරි නිර්මාණයක් බවට පත් කරන්න.
- ගීතය අංග සම්පූර්ණ වීම සඳහා පෙරවාදන / අතුරුවාදන/ Bits / Counter Points / Harmony ආදී කොටස් උචිත අයුරින් යෙදීමට උත්සාහ ගන්න.
- පාසල් ආරම්භ කිරීමෙන් පසුව ඔබ නිර්මාණය කළ ගීතය සංගීත විෂයභාර ගුරුවරයා හමුවේ ඉදිරිපත් කරමින් අඩුපාඩු සකසාගෙන ඔබේ ම ස්වතන්ත්‍ර නිර්මාණයක් ලෙස පාසලේ විවිධ ප්‍රසංගයක දී හෝ පාසල් සාහිත්‍ය සමිතියේ දී ඉදිරිපත් කරන්න.